මීරිගම නිසල තපෝවන භාවනා මධ්‍යස්ථානයේ නව භාවනා ශාලාව ඉදිකිරීමට ඔබේ සහය අවශ්‍යයි

දැනට පවතින පොල් අතු ශාලාව

දනට පිනට ලැදි ඔබ සැමට

අතුරුගිරිය ඥානවිමල විපස්සනා භාවනා මධ්‍යිස්ථානය සහ මීරිගම නිසල තපෝවන භාවනා මධ්‍යස්ථානය යන උභය විහාරාධිපති පූජනීය ගස්නාවේ ඥාණානන්ද නායක මාහිමිපාණන් වහන්සේගේ අනුශාසකත්වයෙන් ලි.ප.අ. බෞකො විහාදේ 2/12/107 දරණ අංක 16, නුගදෙනිය, ලෝලුවාගොඩ, මීරිගම ලිපිනයෙහි පවත්වාගෙන යනු ලබන නිසල තපෝවන භාවනා මධ්‍යස්ථානය දෙස් විදෙස් සැදැහැති පින්වතුන්ගේ බැතිබර දායකත්වයෙන් තවමත් ගොඩනැගෙමින් පවතින රමණීය බිම් පෙදෙසක පිහිටි නිහඬ නිසංසල පුණ්‍ය භූමියකි. එහි වැඩ වාසය කරමින් වත් පිළිවෙත් වල යෙදෙමින් ආධ්‍යාත්මික ගුණ දියුණු කර ගැනීමට වෙහෙසෙන සිල් මෑණියන් වහන්සේලා තුන් නමක් වෙති. ඊට අමතරව නායක මාහිමිපාණන් වහන්සේගේත්, සිල් මෑණියන් වහන්සේලාගේත් මග පෙන්වීමෙන් ශීල භාවනා කටයුතුවල යෙදෙමින් යහගුණ දම්නැණ වඩවා ගැනීමට බලාපොරොත්තු වන දෙස් විදෙස් සැදැහැවතුන් බොහෝ පිරිසක්ද වෙති.

දැනට මේ පිං බිමෙහි ශීල භාවනා දී කටයුතු සඳහා පැමිණෙන පිරිස දිනෙන් දින වැඩිවෙමින් පවතින අතර බොහෝ පිරිසකට සුවසේ එම කටයුතු වල යෙදීමට ඉඩප්‍රස්ථාවක් තවම සකස් වී නොමැත. මෙතෙක් ඒ සඳහා යොදාගත් පොල් අතු ශාලාව මේ වන විට දිරාපත් වී අබලන් වෙමින් පවතී. එනිසා එම පොල් අතු ශාලාව වෙනුවට කල්පවතින පරිදි නව ගොඩනැගිල්ලක් එම ස්ථානයේම ඉදිකරගැනීමට කටයුතු සම්පාදනය කොට ඇත.

නමුත්, නිරන්තරයෙන්ම දානමානාදියෙන් අපට උපකාර කරන ග්‍රාමවාසී සැදැහැති පින්වතුන්ට එවැනි විශාල කර්තව්‍යයක් සඳහා දායකත්වය ලබාදීමට ආර්ථිකමය ශක්තියක් නොමැත්තේය. එනිසාම තපෝවන භූමියෙහි මෙතෙක් ඉදිකරන ලද සංඝාවාසය සහ මෑණියන් වහන්සේලාගේ කුටි පද්ධතිය සඳහා ද අනෙකුත් පූජ්‍යස්ථාන සඳහාද බොහෝ විට මූල්‍යමය දායකත්වය සපයන ලද්දේ නායක මාහිමිපාණන් වහන්සේගේ මගපෙන්වීමෙන් මේ පිළිබඳව දැනගත් නගරවාසී සැදැහැති පිංවතුන් විසිනි. විශේෂයෙන්ම ගෞරවනීය ලොකු ස්වාමීන් වහන්සේගේ උදාරතර අධිෂ්ඨානයෙන් ද පින්වත් පාරමී මෑණියන් වහන්සේගේ අප්‍රතිහත වීර්යයෙන් ද සැදැහැති පින්වතුන්ගේ නොමසුරු දායකත්වයෙන් ද ගොඩනැගුන නිසල තපෝවන පිංබිම වර්තමානයේ බොහෝ උවසු උවැසියන්ගේ නෙත් සිත් නිවා සනසවන සදහම් නිකේතනයක් බවට පත්වෙමින් පවතී.

මේ නිසාම නිසල තපෝවන වාසී මෑණියන් වහන්සේලාටත් ශීල භාවනා දී කටයුතු සඳහා පැමිණෙන පින්වතුන්ටත් සුවසේ වත්පිළිවෙත් වල යෙදීමට පහසු වන සේ පොල් අතු ශාලාව පවතින ස්ථානයේ අලුතින් ස්ථිර ලෙස භාවනා ශාලාවක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාවක් උදා වී ඇත. එබැවින් අනාගතයේ දී බොහෝ පිරිසකට ආධ්‍යාත්මික ගුණ වඩා ගැනීමට නිසැකයෙන්ම පිටුවහලක් වන මෙම නව ගොඩනැගිල්ල ඉදිකර ගැනීම සඳහා සැදැහැති ඔබ සැමගේ සුපින්බර දායකත්වය අපි බලාපොරොත්තු වෙමු.

මෙම මහානීය පුණ්‍ය කටයුත්ත සඳහා ඇස්තමේන්තු කර ඇති සම්පූර්ණ මුදල රුපියල් ලක්ෂ 25 ක් පමණ වන අතර ඒ සඳහා දායක වීමට කැමති පින්වත් ඔබට පහත සඳහන් බැංකු ගිණුම ඔස්සේ තම ශක්ති පමණින් ඒ සඳහා වන මූල්‍යමය පරිත්‍යාග අප වෙත ලබා දිය හැකිය. එමෙන්ම මෙම මහානීය පුණ්‍ය කටයුත්ත සඳහා සම්පූර්ණ දායකත්වය ලබා දිය හැකි යම් පින්වතෙක් වේ නම් ඔහුට මෙම පුණ්‍ය කටයුත්ත භාරගෙන සම්පූර්ණයෙන්ම නිමකොට පූජා කිරීමට ද ඉඩප්‍රස්ථාව සලසාගත හැකිය. ලොවී ලොව්තුරු සියලු සැප ලැබීමට හේතුවන මෙම මහානීය පුණ්‍ය කටයුත්ත සඳහා ශාසනාලයෙන් යුතුව දායක වන ඔබ සැම දෙනාටම රත්නත්‍රයේ ආශිර්වාදයම ලැබේවා යි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.

මෙයට, නාහිමිපාණන් වහන්සේගේ අවසර පරිදි,
නිසල තපෝවනවාසී,
පානළුවේ සතීමා දසසිල් මාතාව



විමසීම්
නිසල තපෝවන භාවනා
මධ්‍යස්ථානය,
අංක 16, නුගදෙනිය,
ලෝලුවාගොඩ, මීරිගම.
දුරකථන
033-2276306/077 8053441/
077 0575858

ගිණුමේ නම
VEN GASNAWE
GNANANANDA THERO

ගිණුම් අංකය 8660030483

බැංකු ශාඛාව
COMMERCIAL BANK -
MIRIGAMA

ඊමේල්
nisalameditation@gmail.com
වෙබ් අඩවිය
www.nisalameditation.org